“(ඔසප් තත්වයෙන්) පිරිසිදු වූවායින් පසු ඇති වන බොර වර්ණය හෝ කහ වර්ණය ගැන අපි ගණන් නොගෙන සිටියෙමු.”

උම්මු අතිය්යා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කරන ලදී. ඇය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට 'බයිඅත්' දිවුරුම් දී සිටියහ: “(ඔසප් තත්වයෙන්) පිරිසිදු වූවායින් පසු ඇති වන බොර වර්ණය හෝ කහ වර්ණය ගැන අපි ගණන් නොගෙන සිටියෙමු.”
[(صحيح] [رواه أبو داود بهذا اللفظ ورواه البخاري بدون زيادة (بعد الطهر]

උම්මු අතිය්යා (රළියල්ලාහු අන්හා) සහාබිවරිය මෙසේ දන්වා සිටියාය: "ඇත්තෙන්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ යුගයේ කාන්තාවන් ඔසප් තත්ත්වයෙන් පිරිසිදු වූ පසු වහනය වන දියර -එය කළු වර්ණයට නැඹුරු වීම හෝ කහ වර්ණයට නැඹුරු වීම - හයිල් තත්ත්වයක් බව සැළකුවේ නැත. එහෙයින් ඔවුන් සලාතය හෝ උපවාසය අත් හැරියේ නැත."

http://sunnah.global/hadeeth/si/show/10014